10 පරිච්ඡේදය

ශ්‍රී ලංකාවේ ස්වාභාවික ආපදා හා ඒවායේ බලපෑම්

10.1 හැඳින්වීම

ඒ ඒ ස්වාභාවික ආපදාවන් සිදු වන ආකාරය පිළිබඳ ව ඉහත පාඩමේ දී ඔබ අවබෝධයක් ලබා ගන්නට ඇත. මෙම පරිච්ඡේදයේ දී අවධානය යොමු කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ සිදු වන ස්වාභාවික ආපද ඇති වන ප්‍රදේශ හා ඒවා අවම කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව ය.

10.1 රූපය :ස්වාභාවික ආපද

ශ්‍රී ලංකාව නිවර්තන කලාපය තුළ පිහිටා ඇති නිසාත්, නිතර කාලගුණ අවපාතවලට ලක් වන බෙංගාල බොක්ක ආශ්‍රයෙන් පිහිටා ඇති නිසාත් නිරන්තරයෙන් ස්වාභාවික ආපදාවලට ලක් වේ. ඉන්දියන් සාගරයේ නිර්මාණය වන භූ තැටියක ආසන්නයේ ශ්‍රී ලංකාව පිහිටා ඇති නිසා අනාගතයේ දී භූමිකම්පාවලට ලක් විය හැකි ය. මෑත කාලයේ ස්වාභාවික ආපද බහුල කලාපයක් ලෙස ආසියාව හඳුනා ගෙන ඇති නිසා ශ්‍රී ලංකාව ද එයට ඇතුළු කොට දැක්වීමට සිදු වේ.

වරෙක මිනිසාගේ පැවැත්මටත් සුභ සිද්ධියටත් හේතු වන ස්වාභාවික පරිසරය තවත් විටක මිනිස් ජීවිතවලට හා දේපළවලට විපත් ගෙන දීම ස්වභාවධර්මයේ සිරිතකි. අන්තර්ජාතික මට්ටමින් සිදු වන ආපද හා සසඳා බැලීමේ දී ශ්‍රී ලංකාවේ සිදු වන ස්වාභාවික ආපද පහළ මට්ටමක පැවතුණ ද ඒවායින් රටට ඇති වන බලපෑම විශාල ය. ජන සංඛ්‍යාවේ වැඩි වීමත් සමඟ පාරිසරික වෙනස්වීම් වේගවත් වීම නිසා ස්වාභාවික ආපද වැඩි වී ඇති අතර ඒවා මඟින් සිදු කරන විනාශය ද විශාල වී ඇත. භූමිකම්පා හා ඒ ආශ්‍රිත ව ඇති වන සුනාමි වැනි ආපද ක්ෂණික ව ඇති වන ඒවා ය. එහෙත් නියඟය වැනි ආපදාවක් වර්ධනය වන්නේ දිගු කාලයක් තුළ ය.

ශ්‍රී ලංකාවේ ආපද කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ගොනු කොට ඇති සංඛ්‍යා ලේඛන අනුව පසු ගිය දශක හතරක පමණ කාලය තුළ ශ්‍රී ලංකාවේ වැඩි ම පවුල් ගණනකට බලපා ඇති ආපදාව වන්නේ ගංවතුර ය. දෙවනුව නියඟයේ බලපෑම දැක්විය හැකි ය. ගංවතුර හා නියඟය නිරන්තරයෙන් ඇති වීමෙන් දිවයිනේ විශාල ප්‍රදේශයකට බලපෑම් ඇති වේ. හදිසියෙන් ඇති වූ, එහෙත් නිතර ඇති නො වන, සුනාමි තත්ත්වය ද ශ්‍රී ලංකාවේ වෙරළ ආශ්‍රිත ප්‍රදේශවලට 2004දී විශාල හානියක් සිදු කරනු ලැබී ය. සුළි සුළං (වාසුළි), නායයාම් වැනි ආපද ශ්‍රී ලංකාවේ විශේෂිත ප්‍රදේශවලට වරින් වර බලපායි. මේවා ඇති වන්නේ විවිධ හේතූන් නිසා ය. ආපද ඇති වීමට බලපාන සාධක ඒ ඒ ආපදාව අනුව වෙනස්වනවා පමණක් නොව, ඒවායින් සමහරක් සම්පූර්ණයෙන් ම රටින් පිටස්තර ප්‍රදේශවල ඇති වීම ද විශේෂ ලක්ෂණයකි. මේ බව පහත දැක්වෙන සටහන මඟින් පැහැදිලි වනු ඇත.

10.2 ස්වාභාවික ආපද ඇති වීමට හේතු

ස්වාභාවික ආපද ඇති වීමට හේතු

භූමිකම්පා

- පෘථිවිය අභ්‍යන්තරයේ ඇති වන ස්වාභාවික චලන
- අවට ප්‍රදේශයේ භූ තැටිවල ක්‍රියාකාරිත්වය.

නියඟ

- වාෂ්පීකරණ උත්ස්වේදනය අධික වීම
- වනාන්තර ගිනි තැබීම හා වන විනාශය
- වායු දූෂණය
- දේශගුණ විපර්යාස (එල්නිනෝ)
- ගෝලීය උණුසුම වැඩි වීම
- සූර්ය කිරණවල තාපය අධික වීම

වාසුළි (සුළි සුළං)

- බෙංගාල බොක්කේ ඇති වන අඩු පීඩන කලාප
- ඊසාන දිග මෝසම් සුළං කාලයේ දී සුළි කුණාටු ඊසාන දිගින් තල්ලු වී ඒම
- ඉහළ වායු ගෝලයේ ඇති වන කැළඹීම්
- අන්තර් මෝසම් කාලවල (මාර්තු, අප්‍රේල් හා ඔක්තෝබර්, නොවැම්බර් මාස) ඇති වන වායු ගෝලීය තත්ත්වය
- වායු ගෝලීය උෂ්ණත්වය වැඩි වීම

අකුණු කුණාටු

- දහවල උෂ්ණත්වය වැඩි වීම
- ගිගුරුම් සහිත වර්ෂාව
- සංවහන ක්‍රියාවලිය

සුනාමි

- සාගර කලාපයේ නායයාමක් සිදු වීම
- පෘථිවි පෘෂ්ඨයේ අභ්‍යන්තර වෙනස් වීම් නිසා ඉන්දියන් සාගරයේ ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය ආශ්‍රිත ව ඇති වන මුහුදු භූමිකම්පා
- මුහුදේ ගිනිකඳු පිපිරීම
- සාගරය මත විශාල උල්කාපාත පතිත වීම
- සාගරය තුළ න්‍යෂ්ටික අත්හද බැලීම් සිදු කිරීම

නායයාම්

- වර්ෂාපතනයේ දැඩි බව
- කඳු සෑදී ඇති පාෂාණ වර්ග
- පොළොවේ කුස්තුර ඇති වීම
- මිනිස් ක්‍රියාකාරකම්(ගස් කැපීම, කඳු ප්‍රදේශවල කැලෑ ගිනි තැබීම හා හේන් ගොවිතැන,ගල් වලවල් හෑරීම හා පිපිරවීම)
- උස් බිම්වල ජල මාර්ග අවහිර කිරීම හා ජලය රඳවා තැබීම)
- පස් කඳු කැපීම
- වාසස්ථාන ඉදි කිරීම සඳහා බෑවුම් ප්‍රදේශ යොදා ගැනීම.

ජල ගැලීම්

- දිගින් දිගට ම අකුණු ගසමින් නොකඩවා ඇදහැළෙන වර්ෂාව
- මෝසම් හා වාසුළි බලපෑම
- ගංගා මුවදෙර අනවසර ඉදිකිරීම්
- කඳුවල වනාන්තර එළිකිරීම
- ගංගාවල රොන්මඩ තැන්පත් වීම
- පස නිරාවරණය වීම හා සෝදා යාම
- පහත්බිම් හා වගුරුබිම් ගොඩ කිරීම
- ජලය බැස යන ස්ථාන අවහිර කිරීම
- උදම් හා කුණාටු රළවල බලපෑම

10.3 : ශ්‍රී ලංකාවේ විවිධ ස්වාභාවික ආපදා ඇති වන ස්ථාන හා එහි බලපෑම්

ඉහත දැක්වූ ආපද ඇති වූ විශේෂ අවස්ථා හා ඒවායේ බලපෑම් වෙන් වෙන් වශයෙන් විමසා බලමු.

ජල ගැලීම්

10.2 රූපය : ජල ගැලීමක්

ශ්‍රී ලංකාවේ ජල ගැලීම් බොහෝ දුරට ඇති වන්නේ නිරිත දිග මෝසම් වැසි ආරම්භක අවස්ථාවේ දී හා නිවර්තන වාසුළි වැඩි වශයෙන් ක්‍රියාත්මක වන ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාසවලදීත් ය. මීට හේතුව මෙම කාලවල අධික වැසි ලැබීම යි. මෙරට ගංගා අතරින් නිරතුරු ගංවතුර තත්ත්වයන් ඇති වන්නේ තෙත් කලාපයේ කළු, කැලණි, නිල්වලා ආදි ගංගා ආශ්‍රිත ව ය. තෙත් කලාපයෙන් ඇරඹී වැඩි දුරක් වියළි කලාපය තුළ ගලා බසින මහවැලි ගඟ ආශ්‍රයෙන් ද, ගං වතුර ඇති වේ. ගංවතුර ආපදවල විශේෂ ලක්ෂණයක් වන්නේ වර්ෂ දෙක තුනකට වරක් චක්‍රීය ලෙස ඇති වීම යි. ශ්‍රී ලංකා ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ දත්ත අනුව මෑතක දී මෙරටට බලපෑ ප්‍රධාන ජල ගැලීම් වාර්තා වී ඇත්තේ 1940, 1957, 1963, 1968, 1978, 1989, 1992 සහ 2003 යන වර්ෂවල දී ය. ශ්‍රී ලංකාවට විශාල වශයෙන් හානි සිදු කළ 2003 වර්ෂයේ ඇති වූ ජල ගැලීම් හා ඒ ආශ්‍රිත බලපෑම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු සටහනක් පහත දැක්වේ.

2003 ජලගැලීම හා එහි බලපෑම

වර්ෂ 2003දී ශ්‍රී ලංකාවට ඇති වූ ජල ගැලීම දිස්ත්‍රික්ක පහකට දැඩි ලෙසත්, තවත් දිස්ත්‍රික්කයකට මඳ වශයෙනුත් හානි පමුණුවා ඇත. ඒ පිළිබඳ විස්තරාත්මක දත්ත පහත සඳහන් වගුවේ දැක්වේ.

10.1 වගුව : 2003 වසරේ ජල ගැලීමේ බලපෑම

දිස්ත්‍රික්කය	බලපෑ පවුල් සංඛ්‍යාව	ඇති වූ මරණ සංඛ්‍යාව	විනාශ වූ නිවාස ගණන	
			සම්පූර්ණයෙන්ම	අර්ධ වශයෙන්
රත්නපුර	34,448	122	3,668	9,531
මාතර	47,642	64	2,145	7,201
හම්බන්තොට	2,241	21	585	649
ගාල්ල	28,173	16	1,533	4,037
කළුතර	24,555	11	944	2,330
නුවරඑළිය	132	01	360	255
එකතුව	**137,221**	**235**	**9,235**	**24,003**

මූලාශ්‍රය : ශ්‍රී ලංකා ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ දත්ත අනුව සකස් කරන ලදී.

වගුවේ සඳහන් තොරතුරුවලට අමතර ව අදාළ දිස්ත්‍රික්කවල තවත් අංශ රාශියකට මෙම ගං වතුර මඟින් විශාල ආලාභ හානි සිදු විය. මේ අතුරින් පාසල් 154කට පමණ හානි සිදු වීම සහ හෙක්ටාර 11,900ක පමණ ප්‍රමාණයක වගා කරන ලද බෝග සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් විනාශ වීම කැපී පෙනේ. ප්‍රධාන ජල සම්පාදන හා ජලගැලීම් පාලනය කරන ව්‍යාපෘති 29කටත්, සුළු වාරිමාර්ග යටතේ ඇති වැව් 69කට සහ අමුණු 675කටත් හානි සිදු වී තිබේ.

නියඟ

ශ්‍රී ලංකාවේ කිසියම් ප්‍රදේශයකට ලැබෙන සාමාන්‍ය වර්ෂාපතනයෙන් 75%කට අඩුව ලැබෙන කාල නියං පවත්නා කාල ලෙස වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය මඟින් දේශගුණ විපර්යාස පිළිබඳ සකස් කරන ලද වාර්තාවක දැක්වේ. මෙවැනි කාල වැඩි පුර දක්නට ලැබෙන්නේ අප්‍රේල් සිට අගෝස්තු දක්වා විහිදෙන යල කන්නයේ දී ය. වියළි කලාපයට අයත් බෙහෝ දිස්ත්‍රික්කවල අවුරුදු 34කට වරක් නියඟයක් ඇති වන අතර අතරමැදි කලාපයේ අවුරුදු 56 අතර කාලයේ නියඟයක් ඇති වන බව පෙනී ගොස් ඇත. එසේ වුව ද, ශ්‍රී ලංකාවට ජාතික වශයෙන් බරපතල හානි සිදු වන නියං තත්ත්වයන් අවුරුදු 10කට වරක්වත් වාර්තා වී ඇත. මෙවැනි කාලවල දී ජල විදුලිබල නිෂ්පාදනය අඩාල වීම, වගා බිම් විශාල වශයෙන් විනාශ වීම, ජල උල්පත් හා කුඩා වැව් සිඳී යාම වැනි අහිතකර ප්‍රතිඵල ඇති වේ. නියං ඇති වීමේ වැඩි ම සම්භාවිතාවක් ඇති දිස්ත්‍රික්ක ලෙස කිලිනොච්චිය, පොළොන්නරුව, අනුරාධපුරය, මඩකලපුව ආදිය හඳුන්වා දිය හැකි ය. මේ බව පහත සඳහන් සිතියමෙන් පැහැදිලි වේ.



10.1 සිතියම : නියං ඇති වීමේ සම්භාවිතාව

මූලාශ්‍රයඃ එම්. ඩී. ගුණසේන, 2003, ගුණසේන ෆිලිප් සිතියම් පොත, 2003

10.3 රූපය : නියං ඇති වූ ප්‍රදේශයක්

ශ්‍රී ලංකාවේ දරුණු ම නියං ඇති වූ කාල ලෙස 1935-1937, 1947-1949, 1953-1956, 1974-1977, 1981-1983, 2003-2004 වැනි වකවානු සඳහන් කළ හැකි ය. මෙම කාල ආශ්‍රයෙන් කෘෂි ද්‍රව්‍ය නිෂ්පාදනය පහළ යාමක් මෙන් ම රටට ආනයන කළ ආහාර ද්‍රව්‍යවල ප්‍රමාණය වැඩි වීමක් ද දක්නට ඇත.

භූමි කම්පා

ශ්‍රී ලංකාව ඉන්දු ඕස්ට්‍රේලියානු තලයේ මධ්‍යයේ පිහිටා තිබීම නිසාත් ප්‍රාග්කේම්බ්‍රිය යුගයේ බිහිවූ පැරණි භූ ස්කන්ධයක් නිසාත් සාපේක්ෂ වශයෙන් භූමිකම්පාවලට ගොදුරු වීම සුලබ නො වේ. එහෙත් පහත දක්වා ඇති පරිදි භූ තැටි ආශ්‍රිත ව ඇති වන වෙනස්කම් නිසා ශ්‍රී ලංකාවේ භූමිකම්පා ඇති වන ප්‍රවණතාව ඉහළ ගොස් ඇත. 1615 සිට 2000 දක්වා ශ්‍රී ලංකාවේ භූ චලන 60ක් පමණ ඇති වී තිබෙන බව මහාචාර්ය විතානගේ පවසා ඇත.

10.4 රූපය : භූමිකම්පා ඇති වූ ප්‍රදේශයක්

ශ්‍රී ලංකාවේ භූ චලන දත්ත ලබා ගත හැක්කේ පල්ලේකැලේ එළිමහන් සිර කඳවුරු ප්‍රදේශයේ ඉදි කර ඇති භූමිකම්පා මානයන්ගෙන් හා පේරාදෙණිය, කොළඹ වැනි විශ්වවිද්‍යාලවලත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේත් සටහන් කරනු ලබන භූමිකම්පා පිළිබඳ දත්ත මඟිනි. භූමිකම්පා ශ්‍රී ලංකාවේ සියලු ම ප්‍රදේශවල ඇති විය හැකි ය. එහෙත් මධ්‍ය කඳුකරය සහ වෙරළබඩ කලාපය මේ සඳහා විශේෂ වැදගත්කමක් උසුලයි.

ශ්‍රී ලංකාව අවට නව තැටි මායිමක් නිර්මාණය වීම නිසා අනාගතයේ දී භූමිකම්පා වැඩි වීමේ අවදානමක් ඇත. ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය තුළ විශාල පිපිරීමක් ඇති වී නව භූතල මායිමක් නිර්මාණය වීම මෙයට හේතුව යි. එම නිසා ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය දෙකඩ වී ඇති බව භූ විද්‍යාඥයෝ පවසති. එහෙයින් මෙම කලාපය තුළ පසු ගිය වකවානුවේ දී රිච්ටර් මාපාංක 5.0ට අඩු භූමිකම්පා රාශියක් ඇති වී තිබේ.

සුනාමි

සාගර පත්ලේ ඇති වන දැඩි භූමිකම්පා නිසා සුනාමි ජනිත වේ. 2004 දෙසැම්බර් 26 දින ඉන්දියන් සාගර ප්‍රදේශයට බලපෑ සුනාමි තත්ත්වය එම කලාපයේ මෑත ඉතිහාසයේ ඇති වූ දරුණු ම ස්වාභාවික ආපදාව වේ. සුමත්‍රා දිවයිනට කි.මී. 250ක් පමණ බටහිරින් ඉන්දු ඕස්ට්‍රේලියානු තැටියේ නැගෙනහිර මායිමේ මුහුදු පත්ලේ රික්ටර් මාපාංක 9.0ක් ලෙස සටහන් වූ මේ භූමිකම්පාව මඟින් දරුණු සුනාමි තත්ත්වයක් ඇති විය. අනපේක්ෂිත ව පැමිණි මෙම ආපදාව මඟින් ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවලට ඇති වූ හානිය අතිවිශාල ය.

10.5 රූපය : සුනාමියෙන් සිදු වූ හානිය

මෙමඟින් 31,000 ඉක්මවන ප්‍රමාණයක් මිය ගිය අතර පුද්ගලයෝ 550,000කට ආසන්න ප්‍රමාණයක් අවතැන් වූහ. දරුණු ම විපත් සිදු වූ දිස්ත්‍රික්ක ලෙස අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, ගාල්ල, මාතර, හම්බන්තොට, මුලතිව්, යාපනය වැනි ඒවා සඳහන් කළ හැකි ය.



10.6 රූපය : 2004 සුනාමියේ අහිතකර ප්‍රතිඵල

මූලාශ්‍රය: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සංඛ්‍යා ලේඛන අනුව සකස් කරන ලදී.

නායයාම්

10.7 රූපය : වටවල නායයාම්

ශ්‍රී ලංකාවේ භූමියෙන් 20% ක් පමණ නායයාම්වලට ගොදුරු වේ. ප්‍රධාන වශයෙන් මැද කඳුකරය ආශ්‍රිත දිස්ත්‍රික්ක හතක් නිතර නිතර නායයාම්වලට ලක්වේ. මීට අමතර ව දකුණු පළාතට අයත් දිස්ත්‍රික්ක තුනේ ද වරින්වර නායයාම් සිදු වේ. මෙම දිස්ත්‍රික්කවල 2003දී ඇති වූ අධික වර්ෂාව හා ජල ගැලීම් සමඟ විශාල වශයෙන් හානිදායක වූ නායයාම් බහුල ලෙස ඇති විය. අදාළ දිස්ත්‍රික්කවල නායයාම් සිදු වන විශේෂිත ස්ථාන පහත සඳහන් වගුවේ දක්වා ඇත.

10.2 වගුව : ශ්‍රී ලංකාවේ නායයාම් සිදු වී ඇති දිස්ත්‍රික්ක හා ස්ථාන

දිස්ත්‍රික්කය	නායයාම් සිදු වී ඇති විශේෂිත ස්ථාන
කෑගල්ල	දෙහිඕවිට, දූරණියගල, ගලිගමුව, යටියන්තොට, අරනායක, රුවන්වැල්ල
බදුල්ල	හාලිඇළ, බෙරගල හපුතලේ මාර්ගය අසල, බණ්ඩාරවෙල
රත්නපුර	පැල්මඩුල්ල, කුරුවිට, බුලුතොට, හෙළඋඩ, කොළොන්න, ඇලපාත
නුවරඑළිය	වලපනේ (නුවරඑළිය මාර්ගය අසල), උඩ හේවාහැට, රම්බොඩ, උඩපුස්වැල්ලාව, නොර්ටන් බ්‍රිජ්
කළුතර	මතුගම, බුලත්සිංහල, උඩුවෙල
මාතලේ	පන්සලතැන්න, පලින්දගම, පිටකන්ද
මහනුවර	ගලගෙදර, නාවලපිටිය, පාතහේවාහැට, පේරාදෙණිය, බහිරව කන්ද, ප්‍රීම්රෝස්කන්ද
මාතර	දෙණියාය, වැලිපිටිය, කෝවිල්කන්ද, පීක්වැල්ල කන්ද, දියදව, ලංකාපුර, නාවිමන
ගාල්ල	තවලම, ඇල්පිටිය

මූලාශ්‍රයඃ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දත්ත අනුව සකස් කරන ලදී.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දත්තවලට අනුව 1986 ජනවාරි, 1989 මැයි සහ ජූනි, 1998 ඔක්තෝබර්, 2003 මැයි යන කාල වකවානුවල දී ප්‍රධාන නායයාම් රාශියක් වාර්තා වී ඇත. 1989 ජූනි මාසයේ ඇති වූ නායයාම්වලින් පමණක් ජීවිත හානි 300ක් පමණ සිදු විය.

සුළි සුළං

10.8 රූපය : සුළි සුළං

ඉන්දියන් සාගරයේ බෙංගාල බොක්ක ප්‍රදේශයේ උපත ලබන වාසුළිවල බලපෑමට ශ්‍රී ලංකාව නිරන්තරයෙන් හසු වේ. මෙම ප්‍රදේශය වෙනත් සාගර සමඟ මිශ්‍ර වීම අඩු නිසා මෙම සාගරයේ උෂ්ණත්වය අධික වේ. එම නිසා වායු ගෝලීය උෂ්ණත්වය ඒකාකාර වේ. මෙම තත්ත්වය නිසා අඩු පීඩන වායු ගෝලීය තත්ත්වයන් නිර්මාණය වේ. එමඟින් වාසුළි නිර්මාණය වීම බොහෝ දුරට සිදු වේ.

ශ්‍රී ලංකාවේ වාසුළි බහුල ව දක්නට ලැබෙන්නේ ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවල දී ය. මෙසේ ඇති වූ වාසුළිවලින් වැඩි හරියක් රටට ඇතුළු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළින් වීම තවත් විශේෂ ලක්ෂණයකි. මෙතෙක් ඇති වූ සුළි සුළංවලින් 1967 ඔක්තෝබර් මාසයේ ඇති වූ හලාවත කුණාටුව හලාවතින් රටට ඇතුළු වූ අතර 1912 දෙසැම්බර් මස ඇති වූ තංගල්ල කුණාටුව තංගල්ල ප්‍රදේශයෙන් ඇතුළු වී කළුතර ප්‍රදේශයෙන් පිටව ගොස් ඇත. අනෙක් සියල්ල ම නැගෙනහිර වෙරළින් රටට ඇතුළු වූ ඒවා ය.

ශ්‍රී ලංකාවේ ඇති වූ සුළි සුළංවලින් දරුණු ම හානිය සිදු වූ වර්ෂ වන්නේ 1922, 1964, 1970, 1978, 1992, 2000 ආදිය යි. 1978 නොවැම්බර් මස ඇති වූ සුළි කුණාටුව මඟින් මිනිස් ජීවිත 900කට වැඩි ප්‍රමාණයක් අහිමි වූ අතර විශාල වශයෙන් දේපළවලට ද හානි සිදු විය.

අකුණු

උණුසුම්, අස්ථායී සහ තෙතමනයක් සහිත වායුගෝලීය තත්ත්ව යටතේ වර්ධනය වන ඉතා උස් කැටි වැහි වලාකුළුවලින් අකුණු සහ ගිගුරුම් ඇති වේ. ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් සෑම කාලයක ම අකුණු දක්නට ඇති අතර බහුල ව ම ඇති වන්නේ මාර්තු, අප්‍රේල් සහ ඔක්තෝබර්, නොවැම්බර් මාසවල දී ය. ශ්‍රී ලංකාවේ කැටි වැහි වලාකුළු නිර්මාණය වන අවස්ථා දෙකකි.

10.9 රූපය : අකුණු

1. සංවහන වැසි ක්‍රියාත්මක වන අවධිය
2. වාසුළි ක්‍රියාත්මක වන අවධිය

අකුණු හේතුවෙන් මිනිසුන්ට හා සතුන්ට මරණ හා තුවාල සිදු වීම, ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනි යන්ත්‍ර හා අනෙකුත් විදුලි උපකරණවලට හානි සිදු වීම සහ ගොඩනැගිලිවලට හානි සිදු වීමත් බහුල ව දක්නට ලැබේ.

10.4 ස්වාභාවික ආපද හඳුනා ගැනීම හා ඒවා අවම කර ගැනීම සඳහා කළ යුතු දේ

ආපදව හඳුනා ගැනීම	ක්ෂණික ව කළ යුතු දේ	කළමනාකරණය සඳහා ගත යුතු පියවර
භූමිකම්පා ● පොළොව චලනය වීම ● විශාල හඬක් පිට වීම ● ගස් කොළන් නිවාස සෙලවීම	● ප්‍රදේශයෙන් ඉවත් වීම ● සන්නිවේදන මාධ්‍යවලට සවන් දීම ● ඉක්මනින් එළිමහන් ප්‍රදේශවලට යාම ● විදුලි රැහැන් හා ගොඩනැගිලි සහිත ප්‍රදේශවලින් ඉවත් වීම ● තමා දැනගත් දේ අන් අයට දැනුම් දීම ● නැවත දැනුම් දෙන තුරු එම ප්‍රදේශවලට නො යාම ● බඩු මුට්ටු නොතකා ජීවිතය පමණක් බේරා ගැනීමට කටයුතු කිරීම	● සන්නිවේදන මාධ්‍යවලට සවන් දී භූමිකම්පා පිළිබඳ සෙවිල්ලෙන් සිටීම ● භූමිකම්පාවලට ඔරොත්තු දෙන ගොඩනැගිලි, නිවාස ඉදි කිරීම ● සැහැල්ලු භාණ්ඩ යන්ත්‍රෝපකරණ භාවිතය ● භූමිකම්පාවක් ඇති විට සුනාමි තත්ත්වයක් ඇති විය හැකි බැවින් සැලකිලිමත් වීම ● ඍතුමය සිදුවීම් පිළිබඳ දැනුවත් කිරීම ● භූ කම්පන මාන සවි කිරීම ● පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම
නායයාම් ● අධික වර්ෂාව ● පොළොව ඉරිතලා ගිලා බැසීම ● බෑවුම්වල වූ ගොඩනැගිලි ඉරිතලා යාම ● පොළොවේ පැලුම් මතු වීම ● හිටිහැටියේ ජල උල්පත් හා මඩ උල්පත් ඇති වීම ● ගල් පස් ආදිය ටික ටික පහළට තල්ලු වීම	● එම ප්‍රදේශවලින් ඉවත් වීම ● නැවත දන්වන තුරු එම ප්‍රදේශවලට නොඒම	● හෙල්මළු වගා ක්‍රමය ඇරඹීම ● ජලය බැස යන කානු පද්ධතියක් ඇති කිරීම ● පස ආරක්ෂා කිරීම සඳහා ගස්වැල් වැවීම ● ජල මාර්ග අවහිර නො කිරීම ● නායයන පස් තට්ටු කම්බි දැල්දමා බැඳ තැබීම ● එවැනි ආපද ප්‍රදේශවල නිවාස ගොඩනැගිලි ඉදි නො කිරීම ● කඳු මුදුන් ප්‍රදේශවල වගා නො කිරීම

වාසුළි • අහස අඳුරු වීම • නොකඩවා ඇද හැළෙන වැස්ස • තද සුළං හැමීම • වෙරළ ප්‍රදේශවල මුහුද ගොඩ ගැලීම	• ගුවන් විදුලියට සවන් දීම • එළිමහනට නො යෑම • කුඩා ළමුන් නිවස තුළ ම රඳවා ගැනීම • සවිමත් වහළක් ඇති තැනක සිටීම • ජනෙල් දොර කවුළු ළඟ නො සිටීම • ශක්තිමත් මේසයක් හෝ කොන්ක්‍රිට් කරන ලද දෙයක් අල්ලා ගැනීම	• අන්තරාදායක ගස් කැපීම • නිරන්තරයෙන් සන්නිවේදන මාධ්‍යවලට සවන් දීම • වාසුළි ඇති කාල පිළිබඳ දැනුවත් වීම • හදිසි අවස්ථාවක දී භාවිතය සඳහා ගමන් මල්ලක් පිළියෙල කර තිබීම • ආපදා මධ්‍යස්ථාන ඇති කිරීම • නිවෙස් සුළඟට ඔරොත්තු දෙන සේ සවිමත් ව නිර්මාණය කිරීම
නියඟ • වැසි නොමැති ව දින 15ට වඩා වැඩි වීම • උෂ්ණත්වය ඉහළ යාම • ගහකොළ මැළවීම • දීප්තිමත් සූර්යාලෝකය • මඩ වගුරු ඉරිතලා යාම • භූ ගත ජල මට්ටම අඩු වීම	• ජලය අරපරිස්සමෙන් භාවිත කිරීම • ගස්වැල් ආවරණ ඉවත් නො කිරීම • තද රස්නයට පස නිරාවරණය නො කිරීම • ඇළ දොළ ගංගා අපවිත්‍ර නො කිරීම. • ජලය අපතේ නො හැරීම	• ඇළ, වේළි, වැව් තැනීම • ගස්වැල් සිටු වීම • ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීමට වනාන්තර නො කැපීම • ජලය අත්‍යවශ්‍ය දෙයට පමණක් භාවිත කිරීම • වැසි ජල ටැංකි සෑදීම • නල ළිං භාවිතය • පාංශු සංරක්ෂණය • ජලය අඩුවෙන් භාවිත වන බෝග වැවීම
ජල ගැලීම් • නොකඩවා වැසි ඇද හැළීම • තද සුළං හා කුණාටු හැමීම හා බීරම • ගං මුවදොර ප්‍රදේශවල ජලය පිරීම • ජලය බැස නො යාම • ඇළ, වේළි පිරී ඉතිරී යාම	• වාසස්ථානවලින් ඉවත් වීම • ජලය එක්රැස් වීමට නොදී බැස යාමට සැලැස්වීම • ගං මුවදොර, ජලාශ ආදී ප්‍රදේශවලින් ඉවත් වීම • ආරක්ෂිත උස් ප්‍රදේශවලට යාම • දේපල නොව ජීවිත රැක ගැනීමට උත්සාහ කිරීම • තාවකාලික කඳවුරු පිහිටුවා ගැනීම	• ජලගැලීම් සහිත ප්‍රදේශවල තට්ටු නිවාස ඉදි කිරීම • උස් ප්‍රදේශවල කැලෑ එළි නො කිරීම • පහත් බිම් ගොඩ කිරීමෙන් වැළකීම • ඔරු පාරු වැනි දෑ ළඟ තබා ගැනීම • ජල මාර්ග පිරිසිදු ව තැබීම හා ඒවා, අවහිර නො කිරීම • ගංගාවල වැලි අධික වශයෙන් ඉවත් නො කිරීම • ජල ගැලීම්වලට ඔරොත්තු දෙන ආකාරයේ නිවාස ගොඩනැගිලි තැනීම

සුනාමි ● මුහුදෙන් විශාල හඬක් පිට වීම ● පොළොව සෙලවීම ● මුහුද සිඳී යාම. ● සතුන්ගේ අස්වාභාවික හැසිරීම් රටා ● මුහුදේ වැලි තලා මතු වීම ● යෝධ රැල්ලක් ඉහළට එසවෙනවාත් සමඟ ම ඒ පසු පස රැලි පවුරක් මෙන් පැමිණීම	● වහාම උස් ස්ථානයකට යාම ● සන්නිවේදන මාධ්‍යවලට සවන් දීම ● සුනාමි රළ වාර කීපයක් ඇති විය හැකි බැවින් එම ප්‍රදේශවලට දනුම් දෙන තුරු නො යාම ● බඩු මුට්ටු එක් රැස් නො කර ජීවිත පමණක් බේරා ගැනීමට උත්සුක වීම.	● වෙරළාසන්න ප්‍රදේශවල ඉදි කිරීම් සිදු නො කිරීම ● සුනාමි තරංගවලට ඔරොත්තු දෙන ගෘහ නිර්මාණ ක්‍රම භාවිත කිරීම ● සැහැල්ලු බඩු මුට්ටු භාවිතය ● සාගර භූමිකම්පා පිළිබඳ දනුවත් වීම ● නීතිරීති හා අණපනත් ප්‍රතිපත්ති සම්පාදනය
අකුණු කුණාටු ● ගිගුරුම් සහිත වැසි ● අකුණු කුණාටු සහිත බීරම	● විදුලි පරිපථ විසන්ධි කිරීම ● එළිමහන් ස්ථානවල සිටීමෙන් වැළකීම ● හුදකලා ගස් අසල හා උස්බිම්වල නො රැඳීම ● අසුන් පිට යාම, පාපැදි, ට්‍රැක්ටර්, වැනි විවෘත වාහන පැදවීමෙන් වැළකීම ● විදුලි උපකරණ සන්නිවේදන උපකරණ භාවිතයෙන් වැළකීම	● නිවාස ගොඩනැගිලිවල විද්‍යුත් පරිපථ සම්බන්ධ භූ ගත කම්බි යෙදීම ● නිවසක් හෝ ගොඩනැගිල්ලක් අසල ගස් නොමැති විට අකුණු සන්නායක යෙදීම ● නිවාස හා ගස් අතර ලෝහමය ද්‍රව්‍ය (-) මඟින් සම්බන්ධතා ඇති නො කිරීම ● අකුණු ගැසීම් පිළිබඳ අනාවැකි පැවසීමේ ක්‍රමවේදයක් සවි කිරීම ● අකුණු කුණාටු බහුල කාල පිළිබඳ අවදියෙන් සිටීම (අප්‍රේල්, මැයි, ඔක්තෝම්බර්, නොවැම්බර්)

ක්‍රියාකාරකම්

1. ශ්‍රී ලංකාවේ ඇති වන ස්වාභාවික ආපද පහත සඳහන් ආකාරයට වර්ග කරන්න.

භූ විද්‍යාත්මක හේතු නිසා ඇති වන	දේශගුණ විපර්යාස නිසා ඇති වන

2. එක් එක් ස්වාභාවික ආපද ඇති වන ප්‍රදේශ දෙක බැගින් ශ්‍රී ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න.

3. ඔබ ජීවත් වන ප්‍රදේශයේ ස්වාභාවික ආපද ඇති වීමට බලපාන මානුෂ ක්‍රියාකාරකම් පහක් ලියන්න.

4. ශ්‍රී ලංකාවේ ඇති වූ ස්වාභාවික ආපද හතරක් තෝරා ගෙන ඒ ඒ ආපදව මඟින් ඇති වූ විනාශකාරී ප්‍රතිඵල වෙන වෙන ම සඳහන් කරන්න.

5. ඔබ ප්‍රදේශයේ බහුල ලෙස ඇති වන ස්වාභාවික ආපද නම් කර ඒවායේ හානිදයක බලපෑම් අවම කර ගැනීමට ඔබගේ යෝජනා ලියන්න.

6. ස්වාභාවික ආපද, ඒවා ඇති වීමට හේතු, එමඟින් ඇති වන විනාශය, ඒවා කළමනාකරණය කරන ක්‍රම ඇතුළත් පින්තූර හා විශේෂිත තොරතුරු ඇතුළු කරමින් පිටු පෙරලනයක් නිර්මාණය කරන්න.